මාධ්‍ය නිවේදන අංක LAE/2023/03

## මැතිවරණ කොමිෂන් සභාව

### තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම්
### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023

**තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ඒ සඳහා සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්/ ආරක්ෂක අංශ නිලධාරීන් වෙත කරනු ලබන නිවේදනයයි.**

2023.01.04 දින නාමයෝජනා කැඳවීම් දැන්වීම නිකුත් කළ පළාත් පාලන ආයතන 340 හි ඡන්ද විමසීම සඳහා තැපෑලෙන් ඡන්දය දීමට සුදුසුකම් ලැබූවන්ගේ අයදුම්පත් භාර ගැනීමේ කාල සීමාව 2023.01.05 දින සිට 2023.01.23 දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් වීමට නියමිත ය. එම දිනය නැවත කිසිසේත්ම දීර්ඝ කරනු නොලැබේ.

02. මෙම ඡන්ද විමසීමේ දී එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ඡන්දහිමියන් ලෙස ලියාපදිංචිව සිටින හා ඡන්ද විමසීම් රාජකාරි සඳහා යෙදවීමට නියමිත සියළුම රාජ්‍ය නිලධාරීන්/ සේවකයන්, විදුහල්පතිවරුන්/ ගුරුවරුන්, එම පළාත්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නිලධාරීන්/ සේවකයන්, තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/ සේවකයන්, දුම්රිය සේවා පවත්වාගෙන යාම පිණිස අත්‍යාවශ්‍යම වන දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/ සේවකයන් සහ දිවයිනේ සියලුම ප්‍රදේශවල ආරක්ෂක කටයුතුවල නිරත වන ත්‍රිවිධ හමුදාවේ, පොලිස් දෙපාර්තමේන්තුවේ සහ සක්‍රීය ආරක්ෂක සේවයේ යොදවා ඇති සිවිල් ආරක්ෂක බලකායේ සාමාජික සාමාජිකාවන් අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළේ දී පෞද්ගලිකව ඡන්ද දීමට නොහැකි වන බව හෝ එසේ වීමට ඉඩ ඇති අපේක්ෂකයන් තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන අතර, තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ කාල සීමාව අවසන් වන තෙක් නොසිට නොපමාව ස්වකීය ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලෙස තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති සියලුම දෙනාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. තවද, මෙම ඡන්ද විමසීමේ දී තැපෑලෙන් ඡන්දය දීම පිණිස ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා වූ තොරතුරු 2022 පළාත් පාලන ආයතන ඡන්දහිමි නාමලේඛනයෙන් නිවැරදිව ලබාගත යුතු බව ද අවධාරණය කරනු ලැබේ.

03. සහතික කිරීමේ නිලධාරීන් විසින් තැපැල් ඡන්ද අයදුම්පත් පෞද්ගලිකවම පරීක්ෂා කර ඉල්ලුම්කරුගේ අනන්‍යතාව පිළිබඳ නිසැක වී සහතික කළ යුතු බවත්, සහතික කරනු ලැබූ අයදුම්පත් හැකි වහාම එම අයදුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී වෙත 2023.01.23 දින හෝ එදිනට පෙර අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබෙන සේ යැවිය යුතු බවත්, එම දිනය නැවත දීර්ඝ නොකරන බවත්, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවත් සියළුම සහතික කිරීමේ නිලධාරීන් වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ. නියමිත කාලසීමාව අවසාන දිනයේ දී හෝ එයට පෙර දිනයේ දී ඉල්ලුම්පත්‍ර තැපෑලට භාරදීම වෙනුවට මැතිවරණ කාර්යාලයට ගෙනවිත් භාරදීම වඩාත් යෝග්‍ය බව සැලකිම යෙහෙකි.

04. තැපැල් ඡන්ද ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන 2022 ඡන්ද හිමි නාමලේඛන තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට (www.elections.gov.lk) පිවිසීමෙන් ද අංක 1919 මගින් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ඇමතීමෙන් ද ලබාගත හැකි ය. ඊට අමතරව අවශ්‍ය වන තොරතුරු ලබාගැනීම සඳහා 2022 පළාත් පාලන ආයතන ඡන්ද හිමි නාමලේඛන පහත සඳහන් ස්ථානවල දී ද ප්‍රදර්ශනය කෙරේ.

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)
- සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල } අදාළ බල ප්‍රදේශයට අයත් වන ඡන්ද ප්‍රදේශයේ නාමලේඛනය
- සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල }

05. මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට තැපැල් ඡන්ද අයදුම් පත්‍ර සම්පූර්ණ කර ගැනීම සඳහා පහසුකම් සපයා දී තිබේ. ඡන්දහිමි නාමලේඛනයේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොවන අයදුම්කරුවන් ඉහත අංක 4හි සඳහන් ස්ථානයකින් ස්වකීය ලියාපදිංචියට අදාළ තොරතුරු ලබාගෙන අයදුම්පත්‍ර සම්පූර්ණ කළ යුතු වේ.

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2023.01. 04

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්,